“මුස්ලිම්වරයාගේ වේට්ටිය කෙණ්ඩයේ අඩක් දක්වා විය යුතුය. ඒ අතර හා වළලු කර අතර පවතින දෑහි වරදක් නැත. නමුත් වළලු කරට වඩා පහළින් ඇති දෑ වනාහි, එය අපා ගින්නෙහිය. කවරෙකු තම වේට්ටිය අහංකාරයෙන් යුතුව බිම ගාවමින් ඇද ගෙන යන්නේද, අල්ලාහ් ඔහු දෙස කරුණා බැල්මෙන් නොබලන්නේමය.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ සඊද් අල් කුද්රී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “මුස්ලිම්වරයාගේ වේට්ටිය කෙණ්ඩයේ අඩක් දක්වා විය යුතුය. ඒ අතර හා වළලු කර අතර පවතින දෑහි වරදක් නැත. නමුත්
වළලු කරට වඩා පහළින් ඇති දෑ වනාහි, එය අපා ගින්නෙහිය. කවරෙකු තම වේට්ටිය අහංකාරයෙන් යුතුව බිම ගාවමින් ඇද ගෙන යන්නේද, අල්ලාහ් ඔහු දෙස කරුණා බැල්මෙන් නොබලන්නේමය.” [صحيح] [رواه أبو داود وابن ماجه وأحمد]

සැබැවින්ම "පිරිමියකුගේ වේටිටිය තිබිය යුත්තේ කෙසේදැ?"යි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. පිරිමියකුගේ පහළ කොටස ආවරණය කළ යුතු දෑ සඳහා තත්ත්වයන් තුනක් තිබේ. පළමුවැන්න: වඩාත් යෝග්යය වනුයේ කෙණ්ඩයේ අඩක් දක්වා පවතින කොටස ආවරණය කිරීමය. දෙවැන්න කිසිදු හෙළා දැකීමකින් තොරව අනුමත කොටස. එය වළලු කර දක්වා වූ කොටසයි. එය පාදය කෙණ්ඩ සන්ධියේ ඉදිරියට නෙරා ඇති අස්ථි දෙකය. තුන්වැන්න: තහනම් කොටස එනම් වළලු කරට වඩා පහළින් පිහිටන සේ ඇඳීමය. එහිදී අපා ගින්න ඔහුට නියම වීම ගැන ඔහු බිය විය යුතුයි. එය ඔහු අහංකාරයට ප්රදර්ශනයට හා අපරාධී ලෙස සිදු කර ඇත්නම් අල්ලාහ් ඔහුගේ ආශිර්වාද බැල්මෙන් ඔහු දෙස බලන්නේ නැත.

http://www.sunnah.global/hadeeth/si/show/4964